**ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ 37 වන වාර් ෂික මහ සභා රැස්වීම් වාර්තාව**

ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ 37 වන වාර් ෂික මහ සභා රැස්වීම 2020 ක් වූ මැයි මස 21 වන දින පෙ.ව. 10.00 සිට ප.ව. 12.30 දක්වා කොළඹ 05, නිලමැදුර, ශ්‍රවණාගාරයේදී සාමාජිකයින් එකසිය දහයකයට අධික සංඛ්‍යාවක සහභාගීත්වයෙන් යුතුව පවත්වන ලදී.

සංගමයේ ගරු සභාපති ප්‍රභාත් චන්ද්‍රකීර් ති මහතා රැස්වීම ආරම්භ කළ බව ප්‍රකාශ කිරීමෙන් අනතුරුව සියළු දෙනා නැඟී සිට ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ තේමා ගීතය ගායනා කරන ලදී. ඉන් අනතුරුව ගරු සභාපතිතුමා අරමුණු පැහැදිලි කිරීම සිදුකරන ලදී.

මෙහිදී නැඟී සිටි චන්ද්‍රරත්න පල්ලේගම මහතා මෙවැනි රැස්වීමක් හදිසියේ කැඳවීමට හේතුවක් නොමැති බවත්, දැනට සිටින විධායක සභාවට කොවිඩ් 19 නිසා රටේ උද්ගතවී ඇති තත්වය සමනය වන තෙක් සංගමයේ කටයුතු කරගෙන යා හැකි බවත්, මෙසේ හදිසි රැස්වීමක් පැවැත්වීමෙන් වාර්ෂිකව සංගමයේ සාමාජිකත්වය අපේක්ෂා කරන සුහද හමුව පැවැත්වීමට නොහැකිවීම පිලිබඳව කනගාටුවන බවත් ප්‍රකාශ කරන ලදී. අරුණ ප්‍රනාන්දු මහතා ද මෙවැනි හදිසි රැස්වීමක් පැවැත්වීම පිලිබඳව ප්‍රශ්න කළ අතර විශේෂයෙන්ම ප්‍රාදේශීය ශාඛා සංගම් මේ සම්බන්ධව දැනුවත් කර තිබේ දැයි විමසන ලදී.

ප්‍රදීපා සේරසිංහ මහත්මිය නැඟී සිටිමින් සංගමයේ ව්‍යාවස්ථාව අනුව කටයුතු කිරීම වඩා යෝග්‍ය බවත් මෙම රැස්ව සිටින මහ සභාව විසින් කරනු ලබන තීරණයකට යටත්ව පැරණි විධායක සභාව තවදුරටත් පවත්වා ගන්නේ ද එසේ නොමැති නම් නව විධායක සභාවට සංගමයේ කටයුතු භාරදෙන්නේ ද යන්න තීරණය කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී. ඩබ්.එම්.එම්.බී. වීරසේකර මහතා සහ මහතා ද ප්‍රදීපා සේරසිංහ මහත්මියගේ මතයට සමානව අදහස් දක්වන ලදී. මේ සම්බන්ධයෙන් ව්‍යවස්ථාව පදනම් කර ගනිමින් දීර්ඝ ලෙස කරුණු ඉදිරිපත් කළ ලේකම් රෝහණ ද සිල්වා මහතා ව්‍යවස්ථානුකූලව නව විධායක සභාවට සංගමයේ කටයුතු පැවරීමේ කිසිදු බාධාවක් නොමැති බවත් ඒ සම්බන්ධයෙන් 36 වන විධායක සභාව සාකච්ඡා කර සම්මත කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

මීළඟට න්‍යාය පත්‍රානුකූලව ගරු ලේකම් රෝහණ ද සිල්වා මහතා 36 වන වාර්ෂික මහ සභා රැස්වීම් වාර්තාව හා 2019.03.28 දින සිට 2020.05.20 දින දක්වා වාර්ෂික වාර්තාව සභාගත කරන ලදී. එම 36 වන වාර්ෂික මහ සභා රැස්වීම් වාර්තාව ප්‍රදීප් රත්නායක මහතා සහ ඩබ්.එම්.එම්.බී. වීරසේකර මහතා මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සංශෝධන රහිතව සභා සම්මත විය. වාර්ෂික වාර්තාවේ 1.1 යටතේ සඳහන් 2019.05.20 යන්න 2020.05.20 ලෙස සංශෝධනයට යටත්ව සභා සම්මත විය.

ගරු භාණ්ඩාගාරික කේ.පී. යෝග චන්ද්‍ර මහතා ඉදිරිපත් කළ 2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා වූ විගණනය කරන ලද වාර්ෂික ගිණුම් වාර්තාව ද සාකච්ඡා කිරීමෙන් අනතුරුව එස් අච්චුදන් මහතා හා කේ.පී.ජී.සුමිත් ශාන්ත මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

ඒ අනුව 37 වන විධායක සභාවට නිතරඟයෙන් තේරී පත් වූ විධායක සභා නිළධාරීන්ට සංගමයේ කටයුතු භාර දීමට තීරණය කරන ලදී. ව්‍යවස්ථානුකූලව නාමයෝජනා කැඳවන ලදුව ඉදිරිපත් කර තිබූ එකම නාමයෝජනාවට අනුව ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ 37 වන විධායක සභාව පහත පරිදි තෝරා පත් කරගන්නා ලදී.

| | | |
|---|---|---|
| ගරු සභාපති | - | ප්‍රදීප් රත්නායක මහතා |
| ගරු ලේකම් | - | අරුණ දේවේන්ද්‍ර මහතා |
| ගරු භාණ්ඩාගාරික | - | ප්‍රදීප් ලක්ෂාන්ත මහතා |
| ජාතික සංවිධායක | - | ඩබ්.එම්.එම්.බී. වීරසේකර මහතා |
| සංස්කාරක | - | ශ්‍රීන් යාපා බොරලැස්ස මහතා |
| නියෝජ්‍ය සභාපතිවරු (05) | - | චන්ද්‍රරත්න පල්ලේගම මහතා |
| | - | ඩබ්.එම්.ඒ.පී.බී.වන්නිනායක මහතා |
| | - | කේ.පී.ජී. සුමිත් ශාන්ත මහතා |
| | - | එස්. අච්චුදන් මහතා |
| | - | සජිත් වෙල්ගම මහතා |
| නියෝජ්‍ය ලේකම් | - | මානෙල් කුලරත්න මහත්මිය |
| සහකාර ලේකම් | - | එස්.පපාකරන් මහතා |
| සහකාර සංස්කාරක | - | එස්.ඩී.තෙවරප්පෙරුම මහතා |
| සහකාර භාණ්ඩාගාරික | - | හර්ෂ ඉලුක්පිටිය මහතා |

විධායක කමිටු සාමාජිකයින්

1. සංජීව බන්දුකීර්ති මහතා
2. එච්.ඒ.කමල් පුෂ්පකුමාර මහතා
3. සුනිල් ගලගම මහතා
4. තනුජා ප්‍රනාන්දු මහත්මිය
5. ටී.යූ.ජී.රත්නායක මහත්මිය
6. ඩබ්.වී.පී.අනුර මහතා
7. දර්ශන දසුන් රාජපක්ෂ මහතා
8. සේහු මොහොමඩ් අල් අමීන් මහතා
9. සී.පී.සමරසිංහ මහතා
10. ඊ.එන්.දයාරත්න මහතා
11. ඩබ්.ජී.ඩබ්.ඥාණදයාලන් මහතා
12. ඒ.සිවබාලසුන්දරන් මහතා
13. ඩබ්.එම්.ජී.එස්.කරුණාරත්න මහත්මිය
14. වයි.එස්.පී.පී. ගුණරත්න මහතා
15. එම්.ඒ.එස්.මධුසංක මහතා

37 වන විධායක සභාවට භාණ්ඩාගාරිකවරයෙක් ඇතුළු පුරප්පාඩු තනතුරුවලට සුදුසු සාමාජිකයින් පත් කරන ලෙස නව සභාපතිතුමා ඉල්ලා සිටින ලදී. ඒ සඳහා හිටපු භාණ්ඩාගාරික කේ.පී. යෝගචන්ද්‍ර මහතා සුදුසු බව යෝජනා වුව ද යෝගචන්ද්‍ර මහතා ඒ සඳහා වෙනත් සාමාජිකයකු පත් කිරීම සුදුසු බව පැහැදිලි කරන ලදී. ඒ සඳහා කමිටු සාමාජිකයකු වන ප්‍රදීප් ලක්ශාන්ත මහතා සුදුසු බව ගරු සභාපති ප්‍රදීප් රත්නායක මහතා යෝජනා කරන ලදී. එම යෝජනාව සුමිත් ශාන්ත මහතා ස්ථිර කරන ලදී. සංගමයේ උප සභාපති වශයෙන් ඩබ්ලිව්.එම්.ඒ.පී.බී. වන්නිනායක මහතා සුදුසු බව රෝහණ ද සිල්වා සහ චන්ද්‍රරත්න පල්ලේගම යන මහත්වරුන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් පත් කරන ලදී. නියෝජ්‍ය ලේකම් වශයෙන් මානෙල් කුලරත්න මහත්මිය සුදුසු බව නදීකා කෞෂල්‍යා මහත්මිය යෝජනා කළ අතර, ගරු සභාපති ප්‍රදීප් රත්නායක මහතා ස්ථිර කරන ලදී.

චන්ද්‍රරත්න පල්ලේගම මහතාගේ සහ එස් අච්චුදන් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සංගමයේ සහකාර ලේකම් ලෙස වී. පපාකරන් මහතා පත් කරන ලදී. එසේම ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතාගේ සහ රෝහණ ද සිල්වා මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සංගමයේ සහකාර භාණ්ඩාගාරික ලෙස හර්ෂ ඉලුක්පිටිය මහතා පත් කර ගන්නා ලදී.

ඉන් අනතුරුව 37 වන වාර් ෂික මහ සභා රැස්වීම සඳහා කිසිදු පූර්ව යෝජනාවක් ඉදිරිපත් කර නොතිබූ බැවින් ඒ පිළිබඳ සභාවේ යෝජනා විමසන ලදී. ප්‍රදීපා සේරසිංහ මහත්මිය නව නිලධාරී මණ්ඩලයට සුභ පතමින් ශ්‍රී ලංකා පරිපාලන සේවාවට වර්තමානයේ මුහුණ දීමට සිදු වී ඇති අභියෝගවලට විශේෂ අවධානයක් යොමු කරන ලෙසත් ඒ සඳහා ප්‍රාදේශීය පාලනය නියෝජනය කරන සාමාජිකයන් සම්බන්ධ කර ගැනීමටත් යෝජනා කරන ලදී. එසේම ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්ට මීට පෙර මහ සභා වලද යෝජනා කර ඇති ආචාර ධර්ම පද්ධතියක් කඩිනමින් සකස් කිරීමට යෝජනා කරන ලදී. ඉහළ තනතුරුවලට ඉතා කණිෂ්ඨ නිලධාරීන් පත් කරන ලෙස සෘජුවම දේශපාලන අධිකාරියට යවන ලද ලිපියක් තමන්ට ලැබී ඇති බවත් මෙවැන් කරුණු වල දී සංගමය මැදිහත් වීම සුදුසු බවත් යෝජනා කරන ලදී. ඉන් අනතුරුව නව සභාපති ප්‍රදීප් රත්නායක මහතා සභාව අමතමින් 36 වන විධායක සභාවට ස්තූතිය පළ කරන ලද අතර, 36 වන විධායක සභාව ආරම්භ කර මෙතෙක් කරගෙන ආ කටයුතු වලට අමතරව සංගමයේ ඉදිරි කටයුතු සිදු කිරීමට අදහස් කරන ආකාරය දීර්ඝ වශයෙන් පැහැදිලි කරන ලදී.

ඉන්පසු නව ලේකම් වන අරුණ දේවේන්ද්‍ර මහතාගේ ස්තූති කථාවෙන් පසු රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

මෙයට,

ප්‍රදීප් රත්නායක
ගරු සභාපති

අරුණ දේවේන්ද්‍ර
ගරු ලේකම්